# ග්‍රාමීය සමාජ සංවිධානය හා ජන ආගම

## RURAL SOCIAL ORGANIZATION AND POPULAR RELIGION IN SRI LANKA

ජී. ජී. නන්දසේන
( නන්දසේන ගමාචිචිගේ )

A 5678

G.G. NANDASENA

116571

දර්ශන සූරි උපාධිය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කළ නිබන්ධයයි.

1983

## සිහිපත් කිරීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය යටතේ ග්‍රාමීය සමාජ සංවිධානය හා ජන ආගම පිළිබඳ ක්ෂේත්‍ර ගවේෂණය කිරීමට ලිඛිත අවසරය ලබාදුන් හිටපු උප කුලපති මහාචාර්ය ටී.බී.කන්ගහ ආරච්චි මහතාටත්, නිතර නිතර කාරුණික උපදෙස්වලින් මා පෝෂණය කිරීමෙහි නිරත ශාස්ත්‍ර පීඨාධිපති මහාචාර්ය විමල් බලගල්ලේ මහතාටත්, පූර්ව ගවේෂණයන්හි නිරතකොට ක්ෂේත්‍ර ගවේෂණ පිළිබඳ දැනීම හා අත්දැකීම් මා තුළ කෙමෙන් වර්ධනයවීමට මං සලසා මෙම ගවේෂණය කිරීමට කාරුණික වූ උපදෙස්වලින් මා පෝෂණය කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ හා සමාජ මානව විද්‍යා අධ්‍යයන අංශයේ අධිපති මහාචාර්ය නන්දසේන රත්නපාල මහතාටත්, මගේ ගෞරවය හිමිවේ.

නන් අයුරින් දිරිදුන් සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය ඒ.වී.සුරවීර මහතා, සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය බී.ඒ. ටෙනිසන් පෙරේරා මහතා, සහ කථිකාචාර්ය එඩ්වින්. කේ.ගනිහිගම මහතාටත්, භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ අල්විස් මහතාටත්, මගේ ස්තූතිය හිමිවේ.

අවුරුදු පහක පමණ කාලයක් තුළ සිදුවූ මෙම ගවේෂණ කර්තව්‍යයේ දී මුහුණදුන් විවිධ කම්කටොලු සිනහ මුසුව ඉවසමින් මා ධෛර්යමත් කළ නන්දා ගමාච්චිගේ මහත්මියගේ සහාය ඉතා අගය කරමි.

සෝබන ලෙස මෙම නිබන්ධය යතුරු ලියනයෙන් ලියාදුන් අශෝකා මානෙල් මොහොට්ටි මෙනෙවියටත්, සිතියම් පිටපත් කරදුන් කාන්ති පතිරණ මෙනෙවියටත්, දත්ත සැපයූ දත්තදායක බවතුන්ටත්, මගේ ස්තූතිය හිමිවේ.

පී.පී. නන්දසේන.

## පටුන


| | | |
|---|---|---|
| කෙටි යෙදුම්. .. .. .. | 2 - | 3 |
| පාරිභාෂික වචන. .. .. .. | 4 - | 6 |
| මුඛ වදනාව. .. .. .. | 8 - | 55 |
| පොදුවේ ගම් හැඳින්වීම. .. .. | 56 - | 87 |
| ගවේෂණයට යොදාගත් ගම් දහය හැඳින්වීම .. | 88 - | 184 |

**1 - පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| ග්‍රාමීය සමාජ සංවිධානය .. .. .. | 185 - | 210 |

**2 - පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| කෘෂිකර්මය ආශ්‍රිත ඇදහිලි විශ්වාස. .. | 211 - | 245 |

**3 - පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| ගැමි ද්වාරකර්ම. .. .. .. | 246 - | 270 |

**4 - පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| ජන ආගමික ඇදහිලි විශ්වාස. .. .. | 271 - | 305 |

**5 - පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| නවීකරණය, සමාජ සංවිධානය හා ජන ආගම. .. | 306 - | 319 |
| උප ග්‍රන්ථය I, II, III,. .. .. | 320 - | 345 |
| දත්ත දායක නාමාවලිය. .. .. | 346 - | 348 |
| ආශ්‍රිත ග්‍රන්ථ (සිංහල.) .. .. .. | 349 - | 353 |
| ආශ්‍රිත ග්‍රන්ථ (ඉංග්‍රීසි). .. .. .. | 354 - | 365 |

# සිතියම්


| සිතියම් අංකය. | | පිටු |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකාව සිතියමේ ගවේෂණ ප්‍රදේශය. | 7 |
| 2. | මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා වසම්. | 9 |
| 3. | මාතර දිස්ත්‍රික්කයේ ආරාම. | 10 |
| 4. | වැලිගම් කෝරළයේ භූගෝලීය හා සංස්කෘතික පිහිටීම | 31 |
| 5. | ගවේෂණයට යොදාගත් ගම් දහයේ පිහිටීම. | 37 |
| 6. | මුණමල්ප ග්‍රා.සේ. වසමේ භූගෝලීය හා සංස්කෘතික පිහිටීම. | 74 (අ) |
| 7. | මුණමල්ප. | 93 |
| 8. | කාගොඩ. | 103 |
| 9. | දූවගොඩ. | 115 |
| 10. | මඩවලහේන. | 122 |
| 11. | වලුගොඩ. | 132 |
| 12. | වෙලවත්ත. - වැලිපිටිය. | 140 |
| 13. | බෙරලෑලිය. | 152 |
| 14. | කෝරත්තගොඩ. | 162 |
| 15. | කොස්ගහහේන. | 168 |
| 16. | උඩුකාව. | 178 |
| 17. | මුණමල්ප, ග්‍රා.සේ. වසමේ කටවුන් වැව් හා ඇලවල්. | 331 |

## විශේෂ සංඛ්‍යාලේඛන හා සටහන්


| අංකය | | | | පිටු |
|---|---|---|---|---|
| 1. | මාතර දිස්ත්‍රික්කයේ ජනගහනය. | | - | 25 |
| 2. | මාතර දිස්ත්‍රික්කයේ සහකාර ආදායම් පාලන ඒකක වශ් නගර ගම් හා ජනගහනය. | 27 | - | 29 |
| 3. | වැල්ගම් කෝරළය (උතුර) අකුරැස්ස, ප්‍රා.උ.දි. කොටසේ ග්‍රා.සේ.වසම් හා ජනගහනය. | | - | 32 |
| 4. | වැල්ගම් කෝරළය (දකුණ) මාලිම්බඩ ප්‍රා.උ.දි. කොටසේ ග්‍රා.සේ.වසම් හා ජනගහනය. | | - | 33 |
| 5. | වැල්ගම් කෝරළය (බටහිර) ප්‍රා.උ.දි. කොටසේ ග්‍රා.සේ.වසම් හා ජනගහනය. | | - | 34 |
| 6. | පරියේෂණ ගම්හි ඉඩම්, නිවාස, හා ජනගහනය. | | - | 57 |
| 7. | සාම්ප්‍රදායක ශිල්පීය ශ්‍රේණි ක්‍රමයෙන් නිපන් කුල ක්‍රමයේ ව්‍යුහාත්මක ස්වරූපය. | | - | 323 |
| 8. | ශිල්පීය ශ්‍රේණිය (කුලය) අනුව තම වෘත්තිය හා පදිංචිය තහවුරු වූ අයුරු. | | - | 324 |
| 9. | ජන ප්‍රධානීන්ට සමාජ සංවිධානයේ අයත් කාර්ය භාරය. | | - | 325 |
| 10. | පුනමල්ප ග්‍රා.සේ.වසමේ ගෘ.මූ.නාමාවලියෙන් හෙළිවන සාම්ප්‍රදායක ශිල්පීය ශ්‍රේණි සබඳතාව. | 325 | - | 328 |
| 11. | නටබුන් වැව් වාරිමාර්ග හා ජල සම්පාදන ක්‍රම. | 329 | - | 332 |
| 12. | ඓතිහාසික ශිල්පීය ශ්‍රේණි ක්‍රමය යටතේ ඉඩම් අයිතිය. | 333 | - | 334 |
| 13. | ශිල්පීය ශ්‍රේණි (කුල ක්‍රමය) යටතේ ඉඩම් බෙදීගිය අයුරු. | | - | 335 |
| 14. | වර්තමාන ඉඩම් බෙදීයාම. | 336 | - | 337 |
| 15. | ආරාමාවලියේ සැකසීම. | 338 | - | 338 |
| 16. | දේව විමානාවලිය. | | - | 339 |
| 17. | අටමගල. (චිත්‍රය). | | - | 340 |
| 18. | පුස්කොළපොත් හා අන් පිටපත් මූලාශ්‍රය. | 341 | - | 345 |

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| වැ.කෝ. | - | වැලිගම් කෝරළය. |
| වැ.කෝ.(බ).ප්‍රා.උ.දි. | - | වැලිගම් කෝරළය (බටහිර) ප්‍රාදේශීය උප දිසාපති. |
| ග්‍රා.සේ. | - | ග්‍රාම සේවා නිලධාරි. |
| ගෘ.මු.අං. | - | ගෘහමුල්ක අංක. |
| කු.නා.අං. | - | කුඹුරු නාමලේඛන අංක. |
| සිං.සං.සං. | - | සිංහල සමාජ සංවිධානය. |
| ජ.වි.සං. | - | ජන ඇදහිලි විශ්වාස හා සමාජ සංවර්ධනය. |
| ස.ර. | - | සද්ධර්ම රත්නාවලිය. |
| ම.ල.ස. | - | මධ්‍යකාලීන ලංකා සමාජය. |
| ම.වං. | - | මහා වංශය. |

# ABBREVIATIONS.

| | | |
|---|---|---|
| CALR | - | The Ceylon Antiquary and Literary Register |
| CJHSS | - | Ceylon Journal of Historical & Social Studies |
| CJSC | - | Ceylon Journal of Science |
| CLR | - | Ceylon Literary Register |
| ESS | - | Encyclopaedia of the Social Sciences |
| JAS | - | Journal of the Asiatic Society |
| JRAS(CB) | - | Journal of the Royal Asiatic Society (Ceylon Branch) |
| MLRC | - | National Monthly Literary Register |
| | | Notes and Queries for Ceylon |
| OR | - | Orientalist : A Journal of Oriental Literature Arts and Science, Folklore etc/. (Bombay) |
| Snhalese Folklore | - | Sinhalese Folklore, Folk Religion and Folk Life |
| SZ | - | Spolia Zeylanica, Bulletin of the National Museum of Ceylon(Colombo) |
| SZM | - | Spolia Zeylanica, Bulletin of the National Museum of Ceylon (Colombo) |

[library stamp]

උප්පිය:-

උපුටාගත් ඵලුව, කුඹා කොටස, අත්ලේ මිටකට එක්වර ගත්හැකි ප්‍රමාණය, ගොයම් වැනි ධාන්‍ය කෙළිමෙදී කපා දමන එක් ගොයම් මිටක් "උප්පිය" ලෙස සැලකේ.

කටවහ:-

ඇස්වහ යට.බ.

කපුවා:-

(සං: කල්පක, පා. කප්පකස්ස) අතරමැදියා මඟුල් කපුවා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර ගැලපීම සිදුකරන අතරමැදියාය.

කැලේ බැද්දෙ ගැස්ම:-

මළ පසු මිනිය වනාන්තරයට ගෙනගොස් දැමීම.

කෙම්:-

ක්ෂේමය හෙවත් යහපත සිදුකරන (සං: ක්ෂේමයය්).

චාරිත්‍ර වාරිත්‍ර:-

යම් ජනතාවක් සතු සිරිත් විරිත් සම්ප්‍රදාය චාරිත්‍ර වාරිත්‍රය (CUSTOMS AND TABOOS) චාරිත්‍ර යනු පිළිපැදිය යුතු වශ්‍යයයි වාරිත්‍ර යනු ගළ යුතු චරියා හෙවත් තහංචියි.

ජන ආගම:-

( FOLK RELIGION ) සංවිහිත බුද්ධසමයට අයත් නොවූ එහෙත් ජනප්‍රිය බුද්ධාගමට (POPULAR BUDDHISM) සම්බන්ධවී ඇති ගැමි ජනතාවගේ විශ්වාස ඇදහිලි පුද පූජා ආදියෙන් සමන්විත සමාජ සංස්ථාව.

දිස්ටිය:-

බැලීම හෙළීම, බැලීම වැටීම, (සං: දෘෂ්ටි) (පාලි+දිට්ඨිය)

ද්වාරකර්ම:- ( RITES OF PASSAGE )

උපත, වැඩිවිය පැමිණීම, විවාහය, මරණය, වැනි මිනිස් දිවිය පිළිබඳව එක් අවස්ථාවක සිට තවත් අවස්ථාවකට පත්වීම, වෙනුවෙන් කරන උත්සව හා චාරිත්‍ර.

ස්තරගත:-

සමාජයක් තුළ සමාජමය වූ හෝ ආර්ථික වූ හෝ ස්තර හෙවත් තට්ටු, තල වශයෙන් බෙදී පවතින.

පේවීම:-

"පෙහෙවීම" යනු නිරුක්තයාර්ථයයි, සූදානම්වීම, ඇප කැපවීම. සං: පෝෂධවාස, පාලි උපෝසථවාස, සිංහල පෙහෙවස්.

පිතෘ වාසික:-

පියාගේ දේපල භුක්ති විඳිමින් එහිම විසීම.

යාතුකර්ම:-

( RITUALS ) පොදු ජන පිටටමේ ඇති යන්ත්‍ර මන්ත්‍ර කෙම්, හූ[illegible] තොවිල් කිරීම ආදිය.

වනපස එක්කිරීම:-

( FOOD GATHERING . ) වනාන්තරයේ ඉබේ වැවෙන දෑ හා ස්වාභාවික ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම සඳහා රැස්කිරීම.


වැදම:-

ගොවිතැන් කිරීමේදී වැඩෙහි යෙදෙන අයට දෙනු ලබන ආහාර පාන ( වැඩවසම් සමයේ රාජකාරි කරන්නන්ට තම වියදම හා යැපීම සඳහා දුන් ඉඩම් "මුත්තෙට්ටුව" නම් විය.) පුරාණයේ අත්තම්මාරුව යටතේ සාමූහිකව ඉටුකළ "කයිය" නමින් හඳුන්වුණු ශ්‍රමදානය වෙනුවෙන් දුන් ආහාරය මුත්තෙට්ටුව දීම ලෙසද මෙහි පැරණි ගැමියෝ හඳුන්වති.

හෝවහ:-

ඇස්වහ යට.බ.

## ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් බෙදීම්




ශ්‍රී ලංකාවේ මිනුම් දෙපාර්තමේන්තු සිතියම ඇසුරිනි

සිතියම අංකය : 1

## <u>මූලාශ්‍රය හා ක්‍රම විද්‍යාව</u>

ශ්‍රී ලංකාවේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ[1] තෝරාගත් ගම් දහයක් ඇසුරෙන් ග්‍රාමීය සමාජ සංවිධානය හා ජන ආගම් අතර ඇති සම්බන්ධතාව විමසා බැලීම මගේ පර්යේෂණයේ පරමාර්ථය විය.

උතුරු අක්ෂාංශ 5° 5' - 9° 51' සහ නැගෙනහිර දේශාංශ 79° 42' - 81° 52' අතර පිහිටි ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ 22%ක් පමණවූ මාතර දිස්ත්‍රික්කය ව. සැ. 481 $\frac{1}{4}$ ක් පමණ වේ. ගාල්ල, රත්නපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවලින්ද මුහුදෙන්ද වටවී ඇති මේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ගම් 694 ක් හා ඒවායේ උපගම් දහස් ගණනක් ඇත. මෙහි ගම්බද ජනගහනය 87.7%කි. සිංහලයන් බහුතරයකුත් සෙසු ජාතීන් සුළු පිරිසකුත් ඇති මෙහි බෞද්ධයන්ගේ ගණන 609131 ක් හෙවත් මුළු ජනගහනයෙන් 93.8% ක් වන අතර ඔවුන් අදහන බෞද්ධාගමේ කේන්ද්‍රස්ථානය වූ පන්සල් 424 කි.[2]

---

1. මාතර දිස්ත්‍රික්කයේ හා වැලිගම් කෝරළය ගැන වැඩි විස්තර සඳහා නියදිගම් තෝරාගැනීම යටතේ 22-42 පිටු බලන්න.

2. මාතර දිස්ත්‍රික්කයේ 1981 ජන සංගණන වාර්තා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මූලික ප්‍රකාශන අංක 1-12 පිටු බලන්න.

   මාතර දිස්ත්‍රික්කයේ බෞද්ධ ආරාම සිතියම 10 පිට බලන්න.

   වැඩි විස්තර සඳහා


   (අ) සංඛ්‍යාලේඛන නිබන්ධය ලංකාණ්ඩු මුද්‍රණය 1968.

   (ආ) අංක 2, 4 සිතියම ද, 31 පිටු බලන්න.

   (ඉ) මාතර දිස්ත්‍රික්කයේ සාපේක්ෂ භූගෝලීය පිහිටීම ගැන ගාල්ල, මාතර, මොරවක, රත්නපුර, අකුරැස්ස සිතියම බලන්න. මිනුම්දෙපා: මුද්‍රණ.

   (ඊ) මාතර දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රමය සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය 1-3 පිටු.

## මාතර දිස්ත්‍රික්කයේ හා වැලිගම් කෝරළයේ පන්සල්.




සිතියම් අංකය 3

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයට[3] අයත් නවීකරණයට අඩුවෙන් ලක්වූ සම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මයේ නිරත සිංහල ගම් දහයක් මෙම අධ්‍යයනය සඳහා මම උපයෝගී කර ගතිමි.[4] මා මේ ආකාරයෙන් ගම් තෝරාගත්තේ සංවිධාන මට්ටමෙන් බලන කල ලංකාවේ ග්‍රාමීය සමාජ සංවිධානය හා ජන ආගම ගැන පොදු අවබෝධයක් මේ ගම් තුළින් ලබාගත හැකි නිසාය. මේ ගම්වල ජන ජීවිතය ගැන අවබෝධයක් ලබාගැනීම මගින් සමස්ත සිංහල ගැමි සමාජය ගැනම අවබෝධයක් ලබාගත හැකිදැයි විමසා බැලීම මෙහිදී අපේක්ෂිත වේ.

අදාළ පූර්වතර පර්යේෂණ:-

මීට ඉහත දී "ග්‍රාමීය සමාජ සංවිධානය හා ජන ආගම අතර ඇති සබඳතාව" පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් මෙරට ඇසුරෙන් කර නැත.[5] සිංහල සමාජ සංවිධානය ගැනත්, ජන ආගම ගැනත් මීට ඉහත කළ තවත් ක්ෂේත්‍ර ගවේෂණ කීපයක්ද ඇත.[6]

---

3 (අ) වැලිගම් කෝරළය වි.සැ: 110 කි. 1981 ජනගහනය 168929 කි. ගැමි ජනතාව 82.9% ක්. ගොවීන් 80% කි. වතු කුලී නිවැසියන් 1126කි. වැලිගම් කෝරළය බටහිර, උතුර, හා දකුණ, යනුවෙන් ප්‍රාදේශීය උප දිසාපතිවරු තුන් දෙනෙකු හා ග්‍රා.සේ. කොට්ඨාශය 66 ද ඇත. වැලිගම හා අකුරැස්ස නගර සභා දෙකකි. මෙහි නාගරික ජනගහනය 2473කි. පන්සල් 106කි.

3 (ආ) වැලිගම් කෝරළය වැඩි විස්තර සඳහා මෙම ග්‍රන්ථයේ 24-36 පිටු බලන්න.

(ඉ) වැලිගම් කෝරළයේ පලාත් බෙදීම ගැන මාතර දිසාපතිගේ පාලන වාර්තාව 1981

(ඊ) මෙහි ආරාම ගැන බෞද්ධ ශාසන කොමිෂන් සභා වාර්තාව සහ අංක 3 සිතියම බලන්න.

4. (අ) ගම් හැඳින්වීම යටතේ 56-184 පිටු බලන්න.

(ආ) වැලිගම් කෝරළය ගැන අංක 4 සිතියම බලන්න (31 පිට)

(ඉ) ලංකාවේ ජීවත්වන මිනිසුන්ගෙන් 82.4% ජීවත්වන්නේ ගම්බද ප්‍රදේශවල බව 1981 ජන හා නිවාස සංගණන වාර්තාවලින් පැහැදිලිවිය. 1981 ජන හා නිවාස සංගණන වාර්තාව, සංඛ්‍යාලේඛන දෙපා: මූලික ප්‍රකාශන අංක 1, කොළඹ. 12 පිට.

5. (අ) මෙම ග්‍රන්ථයේ 349 - 365 පිට බලන්න.

(ආ) ක්‍රම විද්‍යාව යටතේ මෙම ග්‍රන්ථයේ 8-55 පිට බලන්න.

6. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය යටතේ 348-365 පිටු බ.

මීන් සමහරක් ඓතිහාසික සමාජයන් ගැන කරන විග්‍රහයන් වන අතර සමහරක් පොදුවේ මෙරට ගැන කරන විග්‍රහයන්ය. මෙම විද්‍යාඥයන් විටෙක ජන ආගම ගැනත් විටෙක සමාජ සංවිධානය ගැනත් ක්ෂේත්‍ර පර්යේෂණ[6] මගින් සිද්ධාන්තමය වශයෙන් විවිධ අදහස් පළකොට ඇත. මගේ අදහස වූයේ ග්‍රාමීය ප්‍රදේශයක පැරණි සම්ප්‍රදාය තවමත් සැහෙන දුරට නොවෙනස්ව පවත්නා ගම් කීපයක් ඇරගෙන එහි සමාජ සංවිධානය සියුම්ව විමසා බලා එය ජන ආගම ප්‍රමුඛ ජන ජීවිතය සමඟ සසඳා බැලීමය.

<u>මූලාශ්‍රය:-</u>

යම් කිසි ගවේෂණයකදී මූලාශ්‍ර සොයාගැනීමත් ඒවා වර්ග කර ගැනීමත් ගැන ගවේෂණයන් පර්යේෂණ ක්‍රම යටතේ විවිධ විවරණයන් කර ඇත. එෆ්.ස්ටුවර්ට් චැපින් ( F.Stuart Chapin )[7] මූලාශ්‍රය ගැන කර ඇති විවරණය සිත්හි තබාගෙන මෙම ගවේෂණයේදී මා යොදාගත් මූලාශ්‍රය කොටස් දෙකකට බෙදාගතිමි. එනම්

I. ලිඛිත මූලාශ්‍ර

II. අලිඛිත මූලාශ්‍ර යනුවෙනි.

යම්කිසි භාෂාවකින් හෝ මුද්‍රා ක්‍රමයකින් සටහන් වී ඇති තොරතුරු ලිඛිත මූලාශ්‍ර ගණයට අයත්වේ. මෙහිදී පුරා විද්‍යාත්මකව, ඓතිහාසිකව ලැබුන විවිධ දෑ උපයෝගී කරගත් ලිඛිත මූලාශ්‍ර ප්‍රධාන කොටස් කීපයකට බෙදිය හැකිය[8].

I. පුරා විද්‍යාත්මක වස්තු හා වෙනත් සාධක

II. සෙල්ලිපි හා ඓතිහාසික ස්ථාන

III. සිතියම් හා චිත්‍ර

IV. පුස්කොළ පොත් හා අත්පිටපත්

V. ගෘහ මූලික නාමාවලිය හා තුඹුරු නාමලේඛන

VI. මුද්‍රිත පොත්

VII. සඟරා හා පුවත් පත් ලේඛන යනුවෙනි.

---

7: F.Stuart Chapin :Field Work and Social Research,1920.
නන්දසේන රත්නපාල:පර්යේෂණ මූලධර්ම,සර්වෝදය පර්යේෂණ 1980 40-54පිට.

8. ක්ෂේත්‍ර ගවේෂකයෙකුට උපයෝගී කරගත හැකි මූලාශ්‍ර බෙහෙවි. මෙහි සඳහන් වන්නේ මගේ ගවේෂණයේදී බෙහෙවින් ප්‍රයෝජනවත් වූ මූලාශ්‍ර පමණි. සෙසු මූලාශ්‍ර ගැන වැඩි විස්තර සඳහා බලන්න.

(අ) නන්දසේන රත්නපාල:සමාජවිද්‍යා පර්යේෂණ මූලධර්ම 1980,40-54 පිටු.

(ආ) J.Galtung : Theory and ~~Social~~ Methods Of Social Research, Allen and Unwin 1967.

මගේ ගවේෂණයට යොදාගත් පුරා විද්‍යාත්මක වස්තූ අතර වැලිගම අග්‍රබෝධි විහාරයෙන් ලත් අටමගල[9] පන් දේවාල නටබුන් විශේෂයෙන් සඳහන් කළ යුතුය.[10]

වැලිගම අග්‍රබෝධි සෙල්ලිපියද මගේ නිරීක්ෂණවලදී ප්‍රයෝජනවත් විය.[11] ඓතිහාසික වටිනාකමින්යුත් ස්ථාන නාම රසක්ද මෙම ප්‍රදේශයේ සමාජ සංවිධානය හා ජන ආගමේ ප්‍රතිභාසය සොයාගැනීමට බෙහෙවින් ප්‍රයෝජනවත් විය. මේ අතර කොටවිල, රජවත්ත, දෙනිපිටියේ කුමාරවත්ත, තෙලිජ්ජවිල බියෝදොළ, මීරුප්පේ පරක්කවත්ත, වැලිගම ලංගකෝන් මුදලි වලව්ව, සමරවීර මුදලි වලව්ව, උඩුකාවේ නිදංවල, උඩුකාවේ යාපාවලව්ව, (අලුත්ගෙදර) නිදංවලවත්ත මුණපල්පේ යොණවෙල කොටබෝධියද, මුණපල්පේ වැවද, අග්‍රබෝධි විහාරයද, කෝවිලකන්ද විහාරය, සමරවීරාරාමය, පොල්වත්තේ ගංගාරාමය හා ගල්ගනේ විහාරය හා දේවාලය, වැලිහිඳ ශ්‍රී සුදර්ශනාරාමය, කඩොල්ගල්ල ශ්‍රී සුභද්‍රාරාමය, වැනි ආරාමද ඒවායේ ඇති ඓතිහාසික වස්තූද් මගේ නිරීක්ෂණවලදී වැදගත් විය.

මේ පර්යේෂණය සඳහා මා විසින් භාවිතාකරනු ලැබූ පුස්කොලපොත් රසකි. මෙවායේ පැරණිජනාගමික ඇදහිලි විශ්වාස යාතුකර්ම රසක් අඩංගුවී තිබිනි. යන්ත්‍ර මන්ත්‍ර හා බේත්වගී, අඩංගු පුස්කොලපොත් මේ අතුර විශේෂ වැදගත් කමක් ඇතු. මගේ අධ්‍යයනක්ෂේත්‍රයේ ගම්වලුත් ඊට ආසන්න ගම්වලත් ඉතා පුරාණයේ සිට භාවිත යන්ත්‍ර මන්ත්‍රවලට ප්‍රසිද්ධ ප්‍රදේශයකි. මෙහි පුරාණ පුස්කොල පතක් හෝ පොතක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සොයාගැනීමට අපහසු ගෙයක් නැති තරම්ය. මගේ ගවේෂණයේදී සොයාගත් අදාල පුස්කොල පොත් ප්‍රමාණය සිය ගණනකි.[12] ඒවායින් ජන ආගමේ පෞරාණික ස්වරූපයත් ඒ අදහිලි විශ්වාසවල ඇති ස්වරූපයත් ප්‍රකට වෙයි.

ගෘහ මූල්ක නාමාවලිය ගැමි සමාජ සංවිධානය පැරණි ශිල්පීය ශ්‍රේණික්‍රමය අවබෝධ කැරගැනීමට විශේෂයෙන් උදව්වූ මූලාශ්‍රයක් ලෙස මෙහිදී සඳහන් කළ යුතුය. ගෘහ මූල්ක

---

9. අටමගල යනු පැරණි මංගල සංකේත අටකි. එහි පිටපතක් 340 පිටේ ඇත.
10. පැරණි දේවාල ගත සෙසු දේවාල හා දේව යාතුකර්ම ස්ථානවල පිහිටීම් සටහන 339 පිට බලන්න.
11. වැලිගම අග්‍රබෝධි සෙල්ලිපිය හා මාතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික තොරතුරු පිළිබඳව බලන්න.
කඹුරුප්පිටියේ වනරතනහිමි: මාතර මානව වංශය, 1950.
12. ප්‍රදේශයේ භාවිත යන්ත්‍ර මන්ත්‍ර, ජන වෙදකම් පිළිබඳ විස්තර ඇතුලත් පුස්කොලපොත් නාමාවලිය ගැන පිටු 341 - 345 බලන්න.

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය